[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 55 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 1999 දෙසැම්බර් මස 31 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 දෙසැම්බර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.50 තැපැල් ගාස්තුව : රු.3.50

**1999 අංක 55 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 31 වනි දින.]

එල්. ඩී. - ඕ. 48/98.

**1970 අංක 18 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය.

1. මේ පනත 1999 අංක 55 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1970 අංක 18 දරන පනතෙහි 3ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. 1970 අංක 18 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා ) පනතේ 3අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර,ඒ වගන්තිය එහි 3ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය.

"විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකුවීමේ කාලසීමාව දීර්ඝ කිරීම.

3.ආ (1) 1968 සැප්තැම්බර් මස 30 වැනි දින හෝ එදිනට පෙර සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වූ ද -

(අ) ඒ දිනයට පසු එවැනි සාමාජිකයකු වශයෙන් දිගට ම සිටියා වූ හෝ සිටින ; සහ

(ආ) 3 වන වගන්තිය හෝ 3අ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු වීමට තීරණය කර නොමැති වූ ද,

යම් තැනැත්තකු විසින්,ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලැබිය හැකි දිනයකට පෙර විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයකුවීමට තීරණය කරනු ලැබිය හැකි ය.

එසේ වුවද, මේ උපවගන්තියේ සඳහන් සන්නද්ධ හමුදාවල සාමාජිකයකු,මේ උපවගන්තිය යටතේ තීරණයක් ගැනීමට පෙර, මේ වගන්තිය බලාත්මක වීමට පෙර මිය ගොස් ඇති අවස්ථාවක හෝ මේ උපවගන්තිය යටතේ නියම කරනු ලබන දිනයට පෙර මිය යන අවස්ථාවක, ඒ තැනැත්තා, භාර්යාව ; හෝ

H - 022545

ළමයකු නැතහොත් භාර්යාව සහ ළමයකු හෝ භාර්යාව සහ ළමයින් තබා මිය ගොස් ඇත්නම්, ඔහු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයකු වීමට තීරණය කර ඇති ලෙස සළකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයකු වීමට තීරණය කරනු ලබන සෑම තැනැත්තකුම හෝ ඒ උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයකු වීමට තීරණය කර ඇති ලෙස සළකනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට,ඒ මිය ගිය තැනැත්තාගේ කටයුතු පරිපාලනය කරන තැනැත්තා විසින්,1968 ඔක්තෝබර් මස 01 වැනි දිනයෙන් ආරම්භව, අවස්ථාවෝචිත පරිදි,විශ්‍රාම යාමේ දිනයෙන් හෝ මිය ගිය දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා හිඟ තබා ඇති සියලු දායක මුදල්,ඒ මුදල් එක් වර්ෂයකට සියයට හතරක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් ද සමඟ විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කරන ලද තීරණයක් අවසානාත්මක විය යුතුය.

(4) 3 වන වගන්තියේ හෝ 3අ වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, මේ වගන්තියේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.